දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය - 2023

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා අන්තර්ජාතික සංවර්ධන සමායතනය අතර 2019 අප්‍රේල් 11 දින එළඹි අංක 6346-LK දරන ණය ගිවිසුමේ III (ii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර අන්තර්ජාතික සංවර්ධන සමායතනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

තෝරාගත් සංවේදී ස්ථානවල කුඩා වතුහිමියන්ගේ කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව සහ දේශගුණයට ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය, කෘෂිකර්මාන්තය සඳහා ජලය සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 26,829 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 100 වන අතර ඉන් රු. මිලියන 22,804.65 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 85ක් සැපයීම සඳහා අන්තර්ජාතික සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 4,024.35 ශ්‍රී ලංකා රජය හා ප්‍රතිලාභීන් විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2019 මැයි 07 දින ආරම්භ කරන ලද අතර, 2024 ජුනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ මතය අනුව, මාගේ වාර්තාවේ 2.1 වන වගන්තියේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

අංකය	ගිණුම්කරන අඩුපාඩුව	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	දකුණු පළාතේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය සහ ව්‍යාපෘතිය විසින් දරන ලද පිරිවැය යන සංරචක දෙක සදොස් ලෙස එකතු කිරීම හේතුවෙන් වගා ළිං ඉදිකිරිම සඳහා අදාළ සමස්ත ප්‍රතිලාභීන්ගේ දායකත්වය මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 23කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය.	නිරීක්ෂණය සමග එකඟයි. ගණනය කිරීමේදී මෙම දෝෂය සිදුවී ඇත. එය 2024 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කරනු ලැබේ.	ප්‍රතිලාභීන්ගේ දායකත්වය නිවැරදිව ගණනය කළ යුතුය.

(ආ)	නැගෙනහිර පළාතේ බීජ මිලදී ගැනීමට අදාළ ප්‍රතිලාභීන්ගේ දායකත්වය ගණනය කිරීමේදී, 2023 ජූලි සිට දෙසැම්බර් දක්වා ගණනය කරන ලද ප්‍රතිලාභීන්ගේ දායකත්වයේ වටිනාකම, සමස්ත ප්‍රතිලාභීන්ගේ දායකත්වයේ වටිනාකම සඳහා ගෙන නොමැතිබව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස නැගෙනහිර පළාතේ සමස්ත ප්‍රතිලාභීන්ගේ දායකත්වය රු. මිලියන 3කින් අවතක්සේරු වී තිබුණි.	නිරීක්ෂණය සමග එකඟයි. 2024 වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී එය නිවැරදි කරනු ලැබේ.	ප්‍රතිලාභීන්ගේ දායකත්වය නිවැරදිව ගණනය කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 ට අනුව, අස්පෘශ්‍ය වත්කම්, ස්පෘශ්‍ය වත්කම් වලින් වෙන් වෙන්ව වර්ග කළ යුතු වුවද, ගිණුම්කරණ මෘදුකාංග සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා දරන ලද පිරිවැය පිළිවෙලින් රු. මිලියන 3.92 සහ රු. මිලියන 10.98 ක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ස්පෘශ්‍ය වත්කම් ලෙස වර්ග කර තිබුණි.	නිරීක්ෂණය සමග එකඟයි. ඔබගේ නිරීක්ෂණයට අනුව, 2024 වර්ෂය සඳහා ගිණුම් ඉදිරිපත් කිරීමේදී එය වෙන වෙනම පෙන්වීමට කටයුතු කරනු ලැබේ.	අස්පෘශ්‍ය වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සටහන් කළ යුතුය.

2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

අංකය	නීතිරීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි- 103 සහ 104(4)	අස්ථානගත වූ ලැප්ටොප් පරිගණක සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුව පියවර ගෙන නොතිබුණි.	ආරම්භයේදී පත්කළ මූලික විමර්ශන කමිටුව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මු .රෙ .103 (1) යටතේ වූ විමර්ශනය ප්‍රමාද විය.	පසු විපරම් කර අදාළ නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	අංක 01/2019 හා 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය	ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (PSC)රැස්වීම මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු තුනක් පමණක් පවත්වා තිබුණි.	2019/01 චක්‍රලේඛයට අනුව, ජාතික මෙහෙයුම් කමිටුව කැඳවීමේ බලය සහ වගකීම කෘෂිකර්ම අමාත්‍යාංශය සතුය. ඒ අනුව එම කමිටුව 2023 වසරේ 03 වතාවක් අමාත්‍යාංශය විසින් කැඳවා ඇත.	චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (PSC)රැස්වීම මාස දෙකකට වරක් පැවැත්විය යුතුය.
(ඇ)	අංක 01/2022 හා 2022 පෙබරවාරි 07 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය	ව්‍යාපෘති අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම පළමු හා තෙවන කාර්තුවේදී පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි.	කළමනාකාරිත්වය පිළිතුරක් සපයා නොමැත .	චක්‍රලේඛයට අනුව, අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතුය.

3. භෞතික කාර්යසාධනය

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

අංකය	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	ව්‍යාපෘතිය මගින් ලබාදෙන ලද ප්‍රතිපාදනවලින් උතුරුමැද පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 620 මගින් කැළැණික වැව සහ මී කුඹුක් වැව කමත ඉදිකිරීම සඳහා පුද්ගලික ඉදිකිරීම් සමාගමක් සමඟ ගිවිසුම් ගතවී තිබුණි. කැළැණික වැව කමත ඉදිකිරීමේ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 4.5 ක් වූ අතර කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබුණු අත්තිකාරම් මුදලේ වටිනාකම රු. 1,363,288 කි. 2023 දෙසැම්බර් 31 දින වන විටද කැළැණික වැව කමත ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. මී කුඹුක් වැව කමත ඉදිකිරීමේ කොන්ත්‍රාත් වටිනාකම රු. 4,685,627 ක් වූ අතර කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 ක් වූ රු. 1,405,688ක මුදලක් කොන්ත්‍රාත්කරුට අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. අත්තිකාරම් බැඳුම්කරයේ වලංගු කාලය 2022 මැයි 16 දිනෙන් අවසන් විය. මී කුඹුක් වැව කමත ඉදිකිරීම 2023 දෙසැම්බර් 31 දින වන විටද ආරම්භ කර නොතිබුණි.	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරන ලද කමත් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය යටතේ, 2021 වර්ෂයේදී කැළැණික වැව සහ මී කුඹුක් වැව යන ප්‍රදේශවල කමත් 02ක් ඉදිකිරීම සඳහා ඉදිකිරීම් සමාගමක් සමඟ කොන්ත්‍රාත්තුවට එළැඹ ඇත. ඒ අනුව,2021 දෙසැම්බර් මාසයේදී කමත් බිම් ඉදිකිරීම ආරම්භ කිරීම සඳහා බලමුලු ගැන්වීමේ අත්තිකාරම් ලෙස රු. 1,363,287 ක මුදලක් කැළැණික වැව සඳහා ද රු. 1,405,688 ක මුදලක් මීකුඹුක්වැව සඳහා ද ගෙවා ඇත. 2023/06/12 දිනැති චෙක්පත් අංක 530457 මගින් රු. 500,000ක මුදලක් ආපසු ගෙවා ඇති අතර 2024/03/22 දිනැති අංක 570209 චෙක්පත මගින් නැවත රු.500,000 ක මුදලක් ගෙවා ඇත.	ව්‍යාපෘතියේ කාර්යයන් විධිමත් ලෙස කළමනාකරණය කල යුතු අතර අරමුදල් නිසි ලෙස භාවිතා කළ යුතුය. අකාර්යක්ෂම නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුයි. අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ව්‍යාපෘතිය මගින් ලබාදුන් ප්‍රතිපාදනවලින් උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශිර්ෂය 620 මගින් රු. 6,530,461ක් වටිනා අඹගස් වැව කමත ඉදිකිරීම සඳහා 2022 අගෝස්තු 02 වැනි දින පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත ව තිබුණි. ගිවිසුම් ගත විමට පෙර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කමත ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් තෝරා ගෙන අත්පත් කර ගෙන නොතිබුණි. අත්තිකාරම් සුරක්ෂණය මත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් වූ රු.1,306,093 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර 2023 ඔක්තෝබර් 30 දින අත්තිකාරම් සුරක්ෂණයේ කාලය ඉකුත්වී තිබුණි. අත්තිකාරම් සුරක්ෂණ පවරා නොගෙන 2023 දෙසැම්බර් 28 දක්වා දින දිර්ඝ කර තිබුණි.	නිරීක්ෂණය සමග එකඟයි.	ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර නිසි සැලසුමක් සකස් කළ යුතුය. ව්‍යාපෘතියේ අරමුදල් අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතුය.

(ඇ)	ව්‍යාපෘතිය මඟින් ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් උතුරුමැද පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය 620 මඟින් දිවුල් වැව කමත ඉදිකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ ඉංජිනේරු ඇස්තමේන්තුව වූ රු.5,515,810 ක ඉක්මවා රු.6,530,461 ක වටිනාකමට ගිවිසුම් ගත වී තිබුණි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී, අඩුම ලංසුකරුවා නොසලකා තිබුණි. මෙම ව්‍යාපෘතිය නිමකිරීම සඳහා දින 120 ක කාලයක් ගිවිසුම ප්‍රකාරව ලබාදී තිබුණද, අනුරාධපුර නියෝජ්‍ය ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් අවස්ථා හතරකදී එකතුව දින 390 ක දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. 2023 ඔක්තෝබර් වන විට, වැඩ කටයුතු විධිමත් ලෙස භාර දී නොතිබුණි. දිවුල් වැව කමත ඉදිකිරීමේ භෞතික පරීක්ෂණයේදී, BOQ අයිතම අංක 06,07,09 යටතේ දක්වා ඇති ඉදිකිරීම් ප්‍රමිතියෙන් තොර බව අනාවරණය විය.	දිවුල්වැව කමත ඉදිකිරීම සඳහා සියෙරා ග්ලෝබල් සමාගම සමඟ රු. 6,395,461 ක කොන්ත්‍රාත්තුවක් සඳහා අත්සන් කර ඇත. 2022.11.05 දින රු. 1,267,792 ක බලමුලු ගැන්වීමේ අත්තිකාරමක් ලබා දී අතර 2023.12.31 වන විට රු.2,349,671 ක බිල්පත් සඳහා ගෙවීම් කර ඇත. එහි භෞතික ප්‍රගතිය සියයට 95ක් පමණ වන බව වාර්තා වේ.	නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් අවසන් කළ යුතුය. අසම්පූර්ණ වැඩ සහ කොටස් නිවැරදි කළ යුතුය හෝ හානි ආපසු අයකර ගත යුතුය.
(ඇ)	ව්‍යාපෘතිය මඟින් ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් උතුරුමැද පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය 620 මඟින් මීගස්දිගිලිය වැව සහ ඔළුපදුර වැව ප්‍රතිසංස්කරණයේදී වැඩ බිමෙහි කාර්යාලයක් ස්ථාපිත කිරීම, ආරක්ෂකයෙකු යෙදවීම සහ මායිම්ගල් සවි කිරීම ඉටුකර නොතිබුණි. තවද,මීගස්දිගිලිය වැවේ බැම්මේ ස්ථාන 15 ක සහ ඔළුපදුර වැවේ බැම්මේ ස්ථාන 11 ක වේ හුඹස් ඉවත් කිරීම වෙනුවට කෘමිනාශක යොදා තිබුණි. කෘමි නාශක දියර යෙදීමෙන් පසුවද නැවත වේ හුඹස් මතු වී තිබුණි. ඒ අනුව, මීගස්දිගිලිය හා ඔළුපදුර වැව් ප්‍රතිසංස්කරණය සාර්ථක වී නොතිබුණි.	මීගස්දිගිලිය සහ ඔළුපදුර වැව් බැම්මේ ඇතැම් ස්ථාන වේයන් ග්‍රහණයට ලක්ව තිබූ අතර කෘමිනාශක යොදා තත්ත්වය පාලනය කිරීමට පියවර ගෙන ඇත. විගණන නිරීක්ෂණයේ පෙන්වා දී ඇති පරිදි වෙනත් ස්ථානවලින් වේයන් මතුවීම වැළැක්වීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, එකඟ වූ පරිදි මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇති බව දන්වා ඇත.	වැව් බැම්මේ වේයන් ඉවත් කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කළ යුතුය. වාරිමාර්ග පද්ධතියට කෘමිනාශක එකතු නොකළ යුතුය.
(ඉ)	ව්‍යාපෘතිය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ එල්ලංගා පද්ධති 05 ක් යටතේ වැව් 80 ක් රු. මිලියන 613 ක ඇස්තමේන්තුවක් යටතේ සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණි. ඉන් වැව් 30ක් සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 475ක ඇස්තමේන්තුවක් යටතේ කොන්ත්‍රාත් ලබාදී තිබුණු අතර වැව් 50ක් සංවර්ධනය කිරීම අත්හැර දමා තිබුණි. පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන දිස්ත්‍රික් කාර්යාලයේ අධීක්ෂණය යටතේ	පුත්තලම දිස්ත්‍රික්කයේ සංවර්ධනය කිරීමට නියමිත වැව් සංඛ්‍යාව වැව් 30 දක්වා අඩු කිරීමටත්, ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ඩොලර් ප්‍රමාණය අඩුවීම හේතුවෙන් ඉතිරි වැව් සංවර්ධනය අවස්ථා 02කදී අත්හැර දැමීමටත් සිදු විය. පුත්තලම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සංවර්ධනය කරන ලද වැව් 06 වැඩ නිමවීමෙන් පසු ගොවිජන සංවර්ධන	එල්ලංගා පද්ධති 05 යටතේ ඇති වැව් සැලසුම් කර ඇති පරිදි නියමිත වේලාවට නිම කළ යුතුය.

	ආරම්භ කර තිබුණු වලස්වැව, දේවාල කන්ද වැව, සාලිය වැව, පන්සල වැව, ජයන්ති වැව සහ තම්මැන්නාව වැව යන වැව්වල කොන්ත්‍රාත් කාලය අවසන්ව තිබුණ ද ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වී නොතිබුණි.	දෙපාර්තමේන්තුවට පවරා ඇත.	
(ඊ)	දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පුත්තලම දිස්ත්‍රික්කය තුළ රු.මිලියන 63 ක ඇස්තමේන්තුවක් මත වැව් 07 ක් සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත්තු ලබා දී තිබුණි. එම ගිවිසුමෙහි වලංගු කාලය ඉකුත්ව ගියද වැව් 07 හි සංවර්ධනය කිරීමේ කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන්ව නොතිබුණි.	වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද වැව් 07 එහි වැඩ අවසන් කර විධිමත් ලෙස අදාළ ආයතනය වෙත භාරදී තිබුණි.	වැව් සංවර්ධන කටයුතු ගිවිසුම් කාලය තුළ අවසන් කළ යුතුය.
(උ)	දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ, වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව (පුත්තලම) මඟින් වැව් 12ක් සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 222 ක් වූ කොන්ත්‍රාත් 04 ක් ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් කාලය ඉක්මවා ගියද 2023 දෙසැම්බර් 31 වන විට වැව් 7 ක සංවර්ධන කටයුතු අවසන් කර නොතිබුණි.	වයඹ පළාතේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වැව් 12ක් සංවර්ධනය කිරීම සඳහා ගිවිසුම්වලට එළඹ ඇත. වැව් 03ක් හැර ඉතිරි වැව් 09 විධිමත් ලෙස අදාළ ආයතනයට භාර දී ඇත. අනෙකුත් වැව් 03 හි භෞතික ප්‍රගතිය සියයට 95කට වැඩිය.	ව්‍යාපෘතියේ අරමුදල්වලින් කළ යුතු සංවර්ධන කටයුතු නියමිත කාලය තුළ කළ යුතුය. ප්‍රමාදයට හේතු සොයා බලා ප්‍රමාද ගාස්තු අය කළ යුතුය.

3.2 නිෂ්ක්‍රීය/ අක්‍රීය/ ඌන උපයෝජිත සම්පත්

අංකය	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	දිවයිනේ දිස්ත්‍රික්ක 10ක ගොවිජන සේවා මධ්‍යස්ථාන 47ක් සඳහා වී ගොවිතැනට වඩාත් උචිත තාක්ෂණය හඳුන්වාදීමේ අරමුණින් රු. මිලියන 215.43ක් වැය කර යාන්ත්‍රික පැල රෝපණ යන්ත්‍ර 189 ක්, යාන්ත්‍රික වල් නෙලීමේ යන්ත්‍ර 189 ක් සහ බීජ රෝපණ යන්ත්‍ර 95 ක් ලබා දී තිබුණි. එයින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 8ක් සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානවල අවශ්‍යතාවය හා ඉල්ලීමකින් තොරව (රාජාංගනය වම් ඉවුර, තඹුත්ත, ගල්ගමුව, මහානාන්පේරිය, රඹේ, ඇහැටුවැව, අඹස්පොල, මොරගොල්ලාගම) රු. මිලියන 21ක්	ගොවිජන සේවා මධ්‍යස්ථාන 47 සඳහා ලබා දී ඇති මුළු රෝපණ යන්ත්‍ර සංඛ්‍යාව (යන්ත්‍ර 189) සලකා බලන විට, 2023/24 මහ කන්නය දක්වා වී වගා කිරීමේ ප්‍රගතිය ගොවීන් 258ක් විසින් යන්ත්‍ර 115ක් භාවිතා කරමින් අක්කර 495.6ක් වන අතර එය මුළු රෝපණ යන්ත්‍ර සංඛ්‍යාවට සාපේක්ෂව සියයට 61ක භාවිතයකි. එසේම, වයඹ පළාතෙහි යාවත්කාලීන යන්ත්‍ර භාවිත ප්‍රගතිය සලකා බැලීමේදී, ගොවීන් 162 දෙනෙකු විසින් රෝපණ යන්ත්‍ර 27ක් භාවිතා කරමින් අක්කර 283.8 වගා කර ඇත. එබැවින්, රෝපණ යන්ත්‍ර සහ වල් නෙලීමේ යන්ත්‍ර භාවිතය ක්‍රමයෙන් වැඩි වෙමින් පවතින අතර, එමඟින් වී	වගා කරන වී වර්ගයට ගැළපෙන ආකාරයට, ගොවීන්ගේ අවශ්‍යතාවලට, ගොවි බිමට සුදුසු ආකාරයට යන්ත්‍රෝපකරණ හඳුන්වා දිය යුතුයි. නිෂ්ක්‍රීය යන්ත්‍ර ලබා ගැනීමට කටයුතු කළ නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	වැය කරමින් පැල රෝපණ යන්ත්‍ර 35ක්, වල් නෙලීමේ යන්ත්‍ර 32ක් සහ බීජ රෝපණ යන්ත්‍ර 15ක් ලෙස මුළු යන්ත්‍ර 82ක් ලබාදී තිබුණි. එම යන්ත්‍ර ලබා දීමෙන් පසු වගා කන්න 3 කට පසු, 2023 දෙසැම්බර් වන විට, වගා කන්න තුන සඳහාම අක්කර 182.73 ක් ගොවීන් 118 දෙනෙකු පමණක් වගා කර තිබුණි. කෘෂිකාර්මික යන්ත්‍ර වගා කටයුතු සඳහා නොගැලපීම හේතුවෙන් එම ලබාදුන් යන්ත්‍රවලින් පැල රෝපණ යන්ත්‍ර 35 න් 14 ක් එක් වරක්වත් භාවිතා කර නොතිබුණි. ලබා දි තිබුණු වල් නෙලීමේ යන්ත්‍ර 32 න් 13 ක් එක්වරක්වත් භාවිතාකර නොතිබුණු අතර ලබා දී තිබුණු බීජ රෝපණ යන්ත්‍ර 15 න් 14 ක් එක් වතාවක්වත් භාවිතා කර නොතිබුණි. භාවිතා කර තිබුණු යන්ත්‍ර අවස්ථා එකක් හෝ දෙකක් පමණක් භාවිතා කර තිබුණි. ඒ අනුව දරන ලද පිරිවැය නිශ්කාර්ය වී තිබුණි.	අස්වැන්න වැඩි වන අතර ශ්‍රම පිරිවැය සහ කෘෂි රසායන පිරිවැය ඉතිරි වේ.	
(ආ)	උතුරුමැද පළාත් ව්‍යාපෘති කාර්යාලය මඟින් උතුරුමැද පළාතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 12ක් වෙත රු.මිලියන 61ක් වටිනා කෘෂි යන්ත්‍රෝපකරණ ලබා දී තිබුණි. එම යන්ත්‍ර උපකරණ වී අස්වැන්න නෙලීමේ යන්ත්‍ර 02 ක්, පැල රෝපණ යන්ත්‍ර 40 ක්, වල් නෙලීමේ යන්ත්‍ර 40 ක් සහ බීජ රෝපණ යන්ත්‍ර 20 ක් ලෙස ලබා දී තිබුණි. එම යන්ත්‍ර ගොවීන්ගේ හා වගාබිම්වල අවශ්‍යතාවයට නොගැලපීම් හේතුවෙන් භාවිතා නොකර නිශ්කාර්යව ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගාල් කර තිබුණි. ඒ අනුව දරන ලද වියදම නිශ්කාර්ය වී තිබුණි.	කෘෂිකර්ම යන්ත්‍රෝපකරණ ඒකකය පරංගියාවාඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයෙන් සහ නිෂ්පාදන සමාගමක් යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස මුලින් සැලසුම් කර තිබුණද, අනුමැතිය නොලැබීම හේතුවෙන් එම වැඩසටහන වසරක පමණ කාලයක් ප්‍රමාද විය. මේ වන විට, ගොවිජන සේවා මධ්‍යස්ථාන 9 සඳහා උපකරණ ගබඩා කාමර ඉදිකර ඇති අතර එම උපකරණ ක්‍රමානුකූලව ගබඩා කිරීමට කටයුතු යොදා ඇත. එමෙන්ම මෙම කන්නයේ භාවිතා කරන ලද සහ භාවිතා නොකළ උපකරණ (පැල රෝපණ යන්ත්‍ර 18 ක් සහ වල් නෙලීමේ යන්ත්‍ර 16 ක්) සම්බන්ධයෙන් වාර්තාවක් ප්‍රධාන කාර්යාලයට යවා ඇත. භාවිතයට නොගත් උපකරණ වෙනත් ස්ථානවලට යවනු ලැබේ. යම් අලුත්වැඩියාවකින් පසු අස්වනු නෙලීම සඳහා වී අස්වැන්න නෙලීමේ යන්ත්‍ර 02 භාවිතා කර ඇත. මෙයින් 2023/24 මහ කන්නය තුළ ලක්ෂ 9ක ආදායමක් ලබාගෙන ඇත. මෙම යන්ත්‍ර ගොවීන් අතර ප්‍රචලිත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර වැඩසටහන් සැලසුම් කර ඇත.	ගොවීන්ගේ හා ගොවිබිම්වල අවශ්‍යතාවලට නොගැලපෙන යන්ත්‍ර මිලදී ගැනීමට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණ පවත්වා අලාභ අයකරගත යුතුය.

(ඇ)	දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 04 කට අදාල යායවල් 58 ක් ආවරණය වන පරිදි කිලෝමීටර් 223.3 දිග අලිවැටක් ඉදිකිරිමට 2022 වර්ෂයේදී රු.මිලියන139 ක් ඇස්තමේන්තු කර තිබුණි. අලිවැට ඉදිකිරිමට අවශ්‍යා ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන අලිවැට ඉදි නොකර තබ්බෝව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ 2023 දෙසැම්බර් 31 දින වන විටද ගබඩා කර තිබුණි.	උපකරණ පියවරෙන් පියවර සපයන ලද අතර කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2023.07.06 දින සැපයුම්කරු විසින් අවසන් උපකරණ තොගය භාර දෙන ලදී. 2023/24 මහ කන්නය සඳහා ගොවීන් සහ නිලධාරීන් පුහුණු කිරීමෙන් පසු කන්න වගා වැට ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදී. බොහෝ කුඹුරු වගාවන් 2023 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර ගොවි සංවිධාන සඳහා ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් සහ අධික වර්ෂාව හේතුවෙන් කන්නය ආරම්භ වන තෙක් උපකරණ ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගබඩා කර ඇත.	සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කාර්යයන් අවසන් කළ යුතුය. ව්‍යාපෘති කටයුතු ප්‍රමාද වීමට හේතු සොයා බලා එය වළක්වා ගැනීමට උත්සාහ කළ යුතුය.

3.3 මතභේදාත්මක ගනුදෙනු

අංකය	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	අනුරාධපුර පළාත් ව්‍යාපෘති කාර්යාලය විසින් යල කන්නය සඳහා මිලදී ගත් බීජ, කෘෂිකර්ම පහසුකාරක නිලධාරියා මඟින් සියයට 25ක ප්‍රතිලාභි දායකත්වයක් යටතේ ගොවීන් වෙත බෙදා දිය යුතු වුවත්, නියැදි ලෙස විගණන පරික්ෂාවන්ට භාජනය කළ පහසුකාරක නිලධාරින් භාරයේ රු.මිලියන 5 ක් වටිනා බීජ කිලෝග්‍රෑම් 1143.5 ක් බෙදා හැරිමකින් තොරව තිබුණි.	කුරුම්ණි වර්ධනයට පෙර ,මෙම බීජ කෘෂි ළිං යටතේ වගා කිරීම සඳහා ගොවීන්ට බෙදා දෙන ලදී. ඊට අදාළ බීජ ගබඩා කිරීම පිළිබඳව නිලධාරීන් දැනුවත් කරන ලදී .	වගා කිරීමට නියමිත කාලය තුළ බීජ බෙදා හැරීම අවසන් කළ යුතුය.
(ආ)	ගොවීන් වෙත බෙදාදීම සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන උපකරණ ප්‍රසම්පාදනය සඳහා ව්‍යාපෘතිය මඟින් 2021 වර්ෂයේදී රු.මිලියන 50ක් වැය කර තිබුණි. එම කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන උපකරණ ලබාගත් පරංගියාවාඩිය, කෝන්වැව සහ ගලෙන්බිඳුණු වැව ප්‍රදේශවල ප්‍රතිලාභීන් 2,847 කගෙන් එක් අයෙකු පමණක් 2023 දෙසැම්බර් වන විට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරමින් තිබුණි. ඒ අනුව, කොම්පෝස්ට් නිෂ්පාදන උපකරණ සඳහා දරන ලද රු. මිලියන 50ක වියදම නිශ්කාර්ය වි තිබුණි.	මෙම ගොවීන් තෝරා ගැනීමේ පදනම වූයේ, 2021/22 මහ කන්නය වගා කිරීම සහ නිෂ්පාදක සංගම්වල සාමාජිකයන් වීම සහ ඒ වන විට ප්‍රධාන වශයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමයි. ගොවීන් විටින් විට කොම්පෝස්ට් නිෂ්පාදනය සීමා කරන බැවින් ගොවීන් වෙත නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කෙරේ. එසේම, ඔබේ උපදෙස් පරිදි, භාවිත නොකරන සියලුම ද්‍රව්‍ය නැවත අයකර ගැනීමටත්, ලේඛන සකස් කිරීමෙන් පසු අවශ්‍යතා ඇති වෙනත් ආයතනවලට ලබාදීමටත්, එම ගොවීන්ට ප්‍රතිලාභ ලබා නොදීමටත් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ තොරතුරු රැස්කිරීම මේ වන විට ආරම්භ කර ඇත.	කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන උපකරණ වගා අවශ්‍යතා මත බෙදා හැරිය යුතුය. නිකුත් කරන ලද භාණ්ඩ හා බීජ පිළිබඳව පසු විපරම් කර අවශ්‍ය උපදෙස් සහ මග පෙන්වීම ලබා දිය යුතුය.

(ඇ)	ව්‍යාපෘතියේ වයඹ පළාත් කාර්යාලය විසින් වාරිමාර්ග එල්ලංගා පද්ධති 20 ට අයත් වැව් 146 ක් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර තිබුණි. ඊට අදාළ ලිපි ගොනුවල බලයදීම, අනුමත කිරිම, ගෙවීමට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස අසම්පූර්ණ තොරතුරු ඇතුළත් ගොනු පවත්වාගෙන තිබුණි.	නිරීක්ෂණය සමග එකඟයි. මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු ඇති නොවීමට පියවර ගන්නෙමු.	මුදල් වියදම් කිරීමේදී, රජය විසින් පනවා ඇති නීති රීති හා චක්‍රලේඛ අනුව ව්‍යාපෘතිය ක්‍රියා කළ යුතුය.
(ඈ)	දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ වයඹ පලාතේ නියෝජ්‍ය ව්‍යාපෘති කාර්යාලයට අදාලව 2022 හා 2023 වර්ෂවල වවුචර් ගොනු නියැදියක් පරීක්ෂාවේදී, මුදල් රෙගුලාසි 138 හා මුදල් රෙගුලාසි 257 උල්ලංඝණය කරමින් වවුචර් සහතික කිරීමකින් තොරව රු.මිලියන 6ක් ගෙවා තිබුණි. මුදල් රෙගුලාසි 137 උල්ලංඝණය කරමින් ගෙවීම් අනුමත නොකර රු.මිලියන 9ක් ගෙවීම් කර තිබුණි.	නිරීක්ෂණය සමග එකඟයි. මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු ඇති නොවීමට පියවර ගන්නෙමු.	නීතිරීතිවලට පටහැනිව ගෙවීම්වලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණ ගැටලු

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
වයඹ පළාතේ නියෝජ්‍ය ව්‍යාපෘති කාර්යාලය සඳහා කළමනාකරණ සහකාරවරයකු බඳවා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය සඳහා ව්‍යාපෘතිය මාස 09කට වැඩි කාලයක් ගත කර තිබූ අතර නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ ඥාතියකු වූ සුදුසුකම් නොලත් අපේක්ෂකයකු තෝරාගෙන තිබුණි.	විමසුමේ සඳහන් කරුණු පරීක්ෂා කිරීමෙන් පසු වයඹ පළාතේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මෙන්ම ඔහුගේ ඥාති කළමනාකරණ සහකාරවරයාද සේවයෙන් ඉවත් කරන ලදී.	සේවකයන් හා නිලධාරීන් බඳවා ගැනීමේදී, සුදුසුකම් පරීක්ෂා කර බඳවා ගත යුතුය. සුදුසුකම් නොමැති නිලධාරීන් බඳවා ගැනීමට අනුමත කරන ලද නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය.

3.5 පද්ධති හා පාලනයන්

අංකය	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	ව්‍යාපෘතිය ආරම්භයේදී කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපනය කර ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා භාවිතා කළ යුතු වුවද, මෘදුකාංග පද්ධති මිලදී ගැනීම/නිර්මාණය කිරීම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 4කට පසු 2022 සැප්තැම්බර් 22 සහ 2022 ඔක්තෝබර් 17 යන දිනවල සිදු කරන තිබුණි. කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා රු. මිලියන 13.65ක් සහ ගිණුම්කරණ පද්ධතිය සඳහා රු. මිලියන 3.92ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, ගිණුම්කරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ අපේක්ෂිත අරමුණු වෙත ළඟා වී නොතිබුණි.	කළමනාකරණ තොරතුරු පද්ධතිය විෂය පථයේ ස්වභාවය සහ සාධාරණීකරණය සැලකිල්ලට ගනිමින්, ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය STEP යොමු අංකය LK-MOA-315134-CS-CDS හරහා කරගෙන යාමට ලෝක බැංකුව විසින් නිෂ්කාශනය ලබා දී ඇත. ඒ අනුව, GIS පදනම් කරගත් කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙනස් කිරීම, ස්ථාපනය කිරීම, අධීක්ෂණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය සිදු කරන ලදී.	ඍජු කොන්ත්‍රාත් පදනම මත ප්‍රසම්පාදනය කිරීමට වගකිව යුතු සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ ගිණුම්කරණ පද්ධතිය ස්ථාපනය කිරීම ප්‍රමාද කිරීම විමර්ශනය කර ඊට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය.